# මී උණ

# ලෙප්ටොස්පයිරෝසියාව

## කුඹුරු ආශ්‍රිතව වැඩ කරන පුද්ගලයන් ගේ දැනුම වර්ධනය කිරීම සඳහා සැකසුවකි


සෞඛ්‍ය අධ්‍යාපන කාර්යාංශය
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය
අංක 2, කින්සි පාර, කොළඹ 8.

වසංගත රෝග විද්‍යා අංශය
සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශය
231, ද සේරම් පෙදෙස, කොළඹ 10.

# මී උණ යනු කුමක් ද ?

- මී උණ (වෙල් උණ, පතල් උණ, මඩ උණ) යනු මීයන්ගෙන් හා සමහර සතුන් මගින් (ගවයන්, මී ගවයන්) පතුරුවන උණ රෝගයකි


රෝගියකුගෙන් තවත් පුද්ගලයෙකුට මෙම රෝගය බෝ වන්නේ නැත.



රෝග වාහක මීයා

# මී උණ බැක්ටීරියාව …

- මී උණ සෑදෙන්නේ බැක්ටීරියාවක් මගිනි
- රෝගය වැළඳුනු මීයන් පිටකරන මුත්‍රා සමග මෙම බැක්ටීරියාව බාහිර පරිසරයට එක් වෙයි
- කුඹුරු වල ඇති දිය කඩිති හා ජලය රැඳුනු තැන් වල මෙම බැක්ටීරියාව රැඳී තිබේ




ලෙප්ටොස්පයිරා බැක්ටීරියාව

# මෙම බැක්ටීරියාව අපේ සිරුරට ඇතුල් වන්නේ කෙසේද ?

- ශරීරයේ කැපීම්, සීරීම්, තුවාල සහ ඇසට නොපෙනෙන තරමේ සියුම් තුවාල සහිතව කුඹුරු වල වැඩකරන විට
- කුඹුරු ආශ්‍රිත ගලා නොයන දිය කඩිති වල නෑමේදී ඇස්වල සියුම් පටක තුලින්

**එම ජලයේ රැදුනු බැක්ටීරියාව සිරුරට ඇතුළු වේ.**



පාද වල තුවාල ඇත්නම් අවදානම වැඩිය

# මෙම බැක්ටීරියාව අපේ සිරුරට ඇතුල් වන්නේ කෙසේද ?

- මී මුත්‍ර මිශ්‍ර ජලය බීමට ගැනීමෙන් හෝ එම ජලයෙන් කට සේදීමෙන්


  එම ජලයේ රැඳුනු බැක්ටීරියාව සිරුරට ඇතුළු වේ.




මෙසේ මුහුණ සේදිම නොකල යුතුය

# මී උණ වැළඳීමේ අවදානම ...

- පුරන් වූ කුඹුරකට බසින ගොවියෙක් නම් ඔබට මෙම රෝගය වැළඳීමේ අවදානම වැඩිය
- ගොවි මහතුන්ට පමණක් නොව,  කුඹුරට බසින අනික් ශ්‍රමිකයන්ට ද මෙම රෝගය වැළඳීමේ අවදානම ඇත.



පුරන් වූ කුඹුරක්




කුඹුරේ වැඩ කරන කාන්තාවන් පිරිසක්

# රෝග ලක්ෂණ මොනවාද ?

- උණ
- මස්පිඩුවල තදබල වේදනාව
- හිසරදය
- අප්‍රාණික බව

ඉහත ප්‍රධාන රෝග ලක්ෂණ සමග

❖ ඇස් තද රතු පැහැ වීම
❖ වමනය
❖ මුත්‍රා තද කහ පැහැ වීම
❖ මුත්‍රා සමග ලේ යෑම
❖ මුත්‍රා යෑම අඩු වීම

වැනි රෝග ලක්ෂණ ද තිබිය හැක.
සමහර රෝගීන් කලාතුරකින් රෝග ලක්ෂණ නොපෙන්වා වුවද සිටිය හැක.

# සංකූලතා

- නිසි කලට නිසි ප්‍රතිකාර ලබා නොගත හොත් වකුගඩු, හෘදය, මොළය, අක්මාව වැනි අවයව වලට විවිධ බලපෑම් ඇති කරයි.

- මෙහිදී මුත්‍රා තද කහ පැහැ වීම, මුත්‍රා සමග ලේ යෑම, මුත්‍රා යෑම අඩු වීම වැනි රෝග ලක්ෂණ ඇති විය හැක.

- රෝගය තවදුරටත් උත්සන්න වීමෙන් මරණය පවා සිදු විය හැක.

# ප්‍රතිකාර

- මී උණ බෝ කරන්නේ බැක්ටීරියාවක් නිසා ඒ සඳහා ප්‍රතිජීවක ඖෂධ ඇත
- නිසි කලට නිසි ප්‍රතිකාර ගැනීමෙන් රෝගය සම්පූර්ණයෙන් සුව කළ හැක

# මී උණ රෝගයෙන් වැළකී සිටීමට කුමක් කළ යුතු ද ?

1. මීයන් මර්දනය කිරීම
2. කුඹුරු අවට ඇති පරිසරය පිරිසිදුව තබා ගැනීම
3. ජලය රැඳුනු ස්ථාන වල ජලය බැස යාමට සැලැස්වීම




කුඹුර අවට කැලිකසල දැමීමෙන් මීයන් බෝවීම වැඩිවේ




ජලය බැස යාමට සැලැස්වීමෙන් මී උණ ව්‍යාප්තිය පාලනය කළ හැක

# මී උණ රෝගයෙන් වැළකී සිටීමට කුමක් කළ යුතු ද ?

4. වගා බිම් සැකසීමේදී හැකි සෑම අවස්ථාවකම අත් හා පා ආවරණ පැළඳීම

5. මනා ලෙස නියර සැකසීම

6. කුඹුරු වලට හා ජලය රැඳුනු තැන් වලට අනවශ්‍ය ලෙස බැසීමෙන්, නෑමෙන්, අත් පා මුහුණ කට සේදීමෙන් වැළකීම

7. නෑමට හා බීමට ජලය ලබා ගන්නා අනාරක්ෂිත ළිං සතුන් ගේ මළ මුත්‍ර මිශ්‍ර ජලයෙන් අපිරිසිදු වීම වළක්වා ගැනීම සඳහා ළිං බැම්මකින් ආරක්ෂා කිරීම




මනා ලෙස නියර සැකසීමෙන් මී උණ ව්‍යාප්තිය අඩු කළ හැක

# මීයන් මර්දනය සඳහා අනුගමනය කළ හැකි දේ

- ✓ මී නාශක තැබීම
- ✓ මී උගුල් තැබීම
- ✓ මී ගුල් විනාශ කිරීම
- ✓ කබරගොයි, තලගොයි, සර්පයින්, බකමූණන්, බස්සන් වැනි මීයන් ආහාරයට ගන්නා සතුන් විනාශ කිරීමෙන් වැළකීම
- ✓ බකමූණන්, බස්සන් වැනි මීයන් ආහාරයට ගන්නා පක්ෂීන් කුඹුරු ආශ්‍රිතව ගැවසීම වැඩි කිරීම සඳහා ඉනි හෝ පොල්පිති සිටුවීම
- ✓ මීයන් විනාශ කිරීම සඳහා ඔබ දන්නා කෙම් ක්‍රම භාවිතා කිරීම




කබරගොයා

# මී උණ රෝගය වැළැක්වීම සම්බන්ධව ඔබ කළ යුතු දේ මොනවා ද ?

- කුඹුරු, වගුරු බිම්, ඇළවේලි ආශ්‍රිතව නිතර වැඩ වල නියැලී සිටින අය රෝගය වැළැක්වීම පිළිබඳ උපදෙස් ලබා ගැනීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි හෝ ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක හමුවන්න
- මී උණ යැයි සැක කළ හැකි රෝග ලක්ෂණ කිසිවක් ඇත්නම් වෛද්‍යවරයෙකු හමුවන්න. එම වෛද්‍යවරයාට තමා කුඹුරු ආශ්‍රිතව කටයුතු කළ බව ද පවසන්න.




වෛද්‍යවරයෙක් රෝගියෙක් පරීක්ෂා කිරීම

# මී උණ සඳහා ආරක්ෂිත ප්‍රතිකාර

- මී උණට වැඩි අවදානමක් ඇති දිස්ත්‍රික්ක වල පමණක් ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිගේ අධීක්ෂණය යටතේ මෙම ආරක්ෂිත ප්‍රතිකාර ලබා දීම සිදුවේ
- සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයෙන් හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමා ගෙන් (PHI) මෙය නොමිලේ ලබා ගත හැකි වේ
- නිසි කලට නිසි මාත්‍රාව ගැනීම වැදගත් වේ




සතියකට වරක් ආරක්ෂිත ප්‍රතිකාර ගැනීම

# මී උණ රෝගය ඔබ ප්‍රදේශයේ පැතිරී ඇත්නම් කළ යුතු දේ මොනවා ද ?

- ප්‍රදේශයේ රෝගීන් වාර්තා වන්නේ නම් හැකි ඉක්මනින් සෞඛ්‍ය බලධාරීන්ට දැනුම් දෙන්න
- ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමා හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා හමු වී ඔබට අවශ්‍ය වැඩිදුර උපදෙස් ලබා ගන්න




මහජන සෞඛය පරීක්ෂක සමග සාකච්ඡාවක්


ස්තුතියි